Article 11

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

මගේ අංකය / எனது இல. / My No. }
ඔබේ අංකය / உமது இல. / Your No. }
දිනය / திகதி / Date } 2020-12-14

පැමිණිලිකරු : එම්.ජී ගාමිණී විජේකුමාර මයා,
අංක 19, ඉමාඩුව යාය,
පේර කනත්ත,
විල්ගමුව.

වගඋත්තරකරුවන් : 01 ස්ථානාධිපති,
පොලිස් ස්ථානය,
විල්ගමුව.

02 පො.කො 86057 පී.පී.ඒ.එල්.එම් පෙරේරා මයා,
පොලිස් ස්ථානය,
විල්ගමුව.

03 සි.ආ.බ 21567 දිසානායක මයා,
පොලිස් ස්ථානය,
විල්ගමුව.

පැමිණිලි අංකය : **HRC/K/30/11**

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, ඉහත 2 වන හා 3 වන වගඋත්තරකරුවන් විසින් 2011.02.18 වන දින තමන්ට විල්ගමුව නිපෝන් පොලිස් මුරපොළ අසලදී පහරදීමක් සිදුකරන ලද බවත්, එම අවස්ථාවේදී තමාගේ කණෙන් ලේ ගැලූ බවත්, පසුව තමන් විල්ගමුව පොලිස් ස්ථානයට රැගෙන ගොස් සිර මැදිරියේ තබා එහිදීද පහරදුන් බවත්ය.

වගඋත්තර පාර්ශවයන්ගේ කරුණු දැක්වීම :-

වගඋත්තරකාර විල්ගමුව පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා විසින් සිය 2011.03.21 දිනැති වාර්තාව කොමිෂන් සභාව වෙත යොමු කර ඇති අතර, එකී වාර්තාවෙන් දක්වා ඇති පරිදි, 2011.02.18 වන දින



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office } 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone } 94 -11- 2505580 / 81 / 82
සභාපති / தவிசாளர் / Chairperson } 011-2505451
ලේකම් / செயலாளர் / Secretary } 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2505541 / 74
ක්ෂණික / துரித அழைப்பு / Hotline } 1996
ඊමේල් / மின்னஞ்சல் / e-mail } sechrc@gmail.com
වෙබ් / இணையம் / Web } www.hrcsl.lk

විල්ගමුව පොලිස් වසමේ නිපෝන් පාලම පොලිස් මාර්ග බාධකයේ පො.කො 86057 පෙරේරා හා සි.ආ.බ 21567 දිසානායක යන නිලධාරින් රාජකාරියේ යෙදී සිටියදී මෙම පැමිණිලිකරු හිස්වැසුම් නොමැතිව TVS වර්ගයේ යතුරු පැදියකින් පැමිණ ඇති අතර, එහිදී හිස්වැසුම් පැළද නොමැතිවීම මත එය නවත්වන ලෙසට නිලධාරීන් විසින් අණදුන් නමුත් එය නොපිළිපැද අදාළ යතුරුපැදිකරු යතුරුපැදිය ධාවනය කර ඇති බව දක්වා ඇත. නමුත් මීටර් 50 ක් පමණ දුර ගමන් කර පැමිණිලිකරුට යතුරු පැදිය පාලනය කරගත නොහැකිව පාරේ ඇද වැටීමෙන් පසුව නැගිට නිලධාරීන් අසලට පැමිණි බවත්, එහිදී ඔහු බීමත්ව සිටි අතර, ඔහු සතුව අදාළ බලපත්‍රය නොතිබූ බවත් ඒ අනුව පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන අධිකරණ වෛද්‍ය පෝරම 32/11 යටතේ විල්ගමුව රෝහලේ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කර පසුව ඇප මත මුදා හැර ඇති බව සඳහන් කර ඇත.

එසේම මෙහි 02 වන හා 03 වන වගඋත්තර පාර්ශවය විසින්ද කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, බීමත්ව රිය පැදවීම හා රියදුරු බලපත්‍රය, ආදායම් බලපත්‍රය හා රක්ෂණ සහතිකය නොපැවතීම, හිස්වැසුම් පැළඳගෙන නොයෑම යන කරුණු මත මෙම පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන ස්ථානයට ඉදිරිපත් කරන ලද බවත්, නඩු දිනයට පැමිණෙන ලෙස දන්වා ඇප දීමට පොලිස් ස්ථානයෙන් කටයුතු කර ඇති බවත් ය.

**නිරීක්ෂණ :-**

1. 2011.02.19 දිනැතිව පො.කො පෙරේරා සහ සිවිල් ආරක්ෂක නියාමක දිසානායක යන අය විසින් මෙම පැමිණිලිකරු හිස් වැසුම් නොමැතිව පැමිණීම හේතුවෙන් යතුරුපැදිය නවත්වන ලෙසට අණදුන් නමුත් එය නොනවත්වා මීටර් 50 ක් පමණ ධාවනය කර රියදුරුට එය හසුරුවා ගැනීමට නොහැකිව පාරේ ඇද වැටුනු බවත්, ඉන් පසුව ඔහු නැගිට තමන් අසලට පැමිණි බවත්, රියදුරු බලපත්‍රය ඉල්ලූ නමුත් එය ලබා දීමට අපොහොසත් වූ බැවින් උපසේවයේ සිටි නිලධාරියාටද දන්වා පැමිණිලිකරුව ස්ථානයට ඉදිරිපත් කරන ලද බවට දෛනික තොරතුරු සටහන් පොතෙහි 144 පිටුවෙහි ඡේද 1592 හි සටහන් කර ඇති බව කොමිෂන් සභාව හමුවේ නිරීක්ෂණය කර ඇත.

2. 2011.02.18 දිනැති අංක 32/11 දරණ අධිකරණ වෛද්‍ය පෝරමය පරීක්ෂා කිරීමේදී මෙම පැමිණිලිකරු මත්පැන් බී වෙරි වී සිටින බවට සටහන් කර ඇති බවද නිරීක්ෂණය වී ඇත.

3. එසේම දැනට පැමිණිලිකරුට එරෙහිව ඉහත කී සිදුවීම පිළිබඳව අධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවතින බවද කොමිෂන් සභා පරීක්ෂණයේදී අනාවරණය වී ඇත.

4. 2011.02.23 දිනැතිව මහියංගනය රෝහලෙහි අධිකරණ වෛද්‍ය නිලධාරීන් විසින් නිකුත් කර ඇති අධිකරණ වෛද්‍ය වාර්තාව දෙස අවධානය යොමු කිරීමේදී පහත පරිදි තුවාල සිදුවී ඇති බව නිරීක්ෂණය වී ඇත.

බරපතල නොවන තුවාල 02 ක් සම්බන්ධයෙන් හා තෙවන තුවාලය වශයෙන් එක් කණක තාවකාලික ඇසීම අඩුවීමක් (impairment of the hearing of a ear temporary) සිදුවී ඇති බවට සටහන් කර ඇති අතර, අදාළ සියළු තුවාල මොට ආයුධයක් මඟින් සිදුව ඇති බවටද වෛද්‍ය වාර්තාව මඟින් කරුණු ඉදිරිපත් කර ඇත.

5. පැමිණිලිකරු දක්වන පහරදීම් ආකාරයන් හා තුවාල සිදුවී ඇති ආකාරය සැසඳෙන බවද නිරීක්ෂණය වේ.

6. තවද පැමිණිලිකරුට 02 හා 03 වන වගඋත්තරකාර පාර්ශවයන් වෙතින් පහරදීමක් සිදුකරන ලද බව දුටු බවට සාක්ෂිකරුවන් තිදෙනෙකු විසින් කොමිෂන් සභාව වෙත සාක්ෂි ඉදිරිපත් කර ඇත.

නිගමනය :-

ඉහත සඳහන් සියළුම කරුණු දෙස අවධානය යොමු කිරීමේදී 02 හා 03 දරණ වගඋත්තරකරුවන් විසින් මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු වෙත පහරදීමක් සිදුකර ඇති බව අධිකරණ වෛද්‍ය වාර්තාව හා ඉදිරිපත් වී ඇති සාක්ෂි මත අනාවරණය වී ඇති අතර, එකී පහරදීම හේතුවෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව යටතේ දක්වා ඇති මූලික අයිතිවාසිකම පැමිණිලිකරු සම්බන්ධයෙන් උල්ලංඝනය වී ඇති බවට පරීක්ෂණයෙන් අනතුරුව තීරණය කරනු ලැබේ.

නිර්දේශය :-

01. 01, 02 හා 03 වන වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරුට රු. 5000/- බැගින් වූ මුදලක් ගෙවිය යුතුය.

02. මෙහි පිටපත් සුදුසු ඉදිරි පියවර ගැනීම සඳහා පොලිස්පතිවරයා වෙතද යොමු කරන බව දන්වනු ලැබේ.

2021.01.15 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට හෝ එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එච්. ගසාලි හුසේන්
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

රමණී මුත්තෙට්ටුවේගම
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත :- පොලිස්පති
පොලිස් මූලස්ථානය
කොළඹ 01

B/

**සැ.යු -: අදාළ මුදල 'මුදල් ඇණවුමක්' මගින් පැමිණිලිකරු වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාවට ලැබීමට සැළැස්විය යුතුය.**